15
පාඩම
पञ्चदशः पाठः ।

# कथं कदा कियत् कुत्र

कथं कदा कियत् कुत्र - किमर्थं किं करोम्यहम् ।
कस्यार्थे च कया शक्त्या - चिन्तयेयं मुहुर्मुहुः ॥

## අභ්‍යාසය 01

• වගුවල දක්වා ඇති රටාවන් අධ්‍යයනය කර, ඉදිරියෙන් දක්වා ඇති කොටුවෙහි වාක්‍ය තනා ලියන්න.

| सः | कथं | खादति ? |
|---|---|---|
| | आनन्देन, लोभेन,<br>लज्जया, शान्त्या<br>त्वरया<br>शीघ्रं, मन्दं मन्दम् | |

| सः | किं | खादति ? |
|---|---|---|
| | ओदनं, मांसं, पयोहिमं<br>फलं, रसगोलं, सेवाफलं,<br>आम्रफलं, दालिं, जम्बीरं,<br>कदलीफलं | |

| सः | किं | खादति ? |
|---|---|---|
| | भोजनालये, गृहे<br>बन्धुगृहे, आश्रमे,<br>नेवासिकागारे<br>वृक्षमूले, नदीतले | |

| सः | कदा | खादति ? |
|---|---|---|
| | प्रभाते, सप्तवादने<br>मध्याह्ने<br>अपराह्णे, रात्रौ, चतुर्वादने<br>पञ्चवादनात् पूर्वं | |

| सः | किमर्थं | खादति ? |
|---|---|---|
| | शक्तिलाभार्थं<br>जीवनधारणार्थं<br>स्वास्थ्यलाभार्थं<br>क्षुधानिवारणं | |

| सः | कथं | पठति ? |
|---|---|---|
| | शुद्धं, अशुद्धं, स्पष्टं<br>अस्पष्टं, ध्यानपूर्वकं<br>वारंवारं, तूष्णीं | |

| सः | किं | पठति ? |
|---|---|---|
| | सस्कृतं, मातृभाषां | |
| | गणितं, भूगोलं | |
| | इतिहासं, आंगलभाषां | |

## ක්‍රියාකාරකම 01

ක්‍රියාපදයක් තනනු ලබන්නේ ධාතුවකට විවිධ ප්‍රත්‍යය එකතු කිරීමෙනි. ක්‍රියාපදයක මුල් අවස්ථාව ධාතුව නම් වේ. සංස්කෘත භාෂාවේ ධාතු 2000කට අධික ප්‍රමාණයක් පවතී. ඒවායෙහි සුවිශේෂ වෙනස්කම් මත ඒවා පොදුවේ කොටස් දහයකට බෙදා ඇත. දශධාතු ගණ වශයෙන් එම කොටස් හැඳින් වේ.

උදා-: පඨති යනු ක්‍රියාපදයකි. මෙහි ධාතුව ' පඨ් ' යන්නයි.
ධාවති - ධාව්, ඛාදති - ඛාද්, හසති - හස්

| | | | |
|---|---|---|---|
| **धावति ।** | - (දුවයි) | **गच्छति ।** | - (යයි) |
| **हसति ।** | - (සිනාසෙයි) | **लिखति ।** | - (ලියයි) |
| **खादति ।** | - (කයි) | **पिबति ।** | - (බොයි) |
| **पूजयति ।** | - (පුදයි) | **क्रीडति ।** | - (සෙල්ලම් කරයි) |
| **पठति ।** | - (කියයි) | **विशति ।** | - (පිවිසෙයි) |

යනු ක්‍රියාපද කිහිපයකි.

ඉහත ක්‍රියාපදවල අග ඇති '**ති**' ප්‍රත්‍යය සියල්ලට ම පොදු වේ. එම '**ති**' ප්‍රත්‍යය ඉවත් කරමු.

උදා-: **धाव** + **ति** = **धाव**

| | | | | |
|---|---|---|---|---|
| **धावति** | **गच्छति** | **हसति** | **लिखति** | **खादति** |
| **पिबति** | **पूजयति** | **क्रीडति** | **पठति** | **विशति** |

එවිට ක්‍රියාපදයෙහි තේරුම වෙනස් වේ. **धावति** යනු දුවයි යන්නයි. එහෙත් **धाव** යනු දුවන්න යන්නයි.

## අභ්‍යාසය 02

● සුදුසු පරිදි හිස්තැන් පුරවන්න.

1. යන්න ........................ 2. සිනාසෙන්න ........................

3. ලියන්න ........................ 4. කන්න ........................

5. බොන්න ........................ 6. පුදන්න ........................

7. සෙල්ලම් කරන්න ........................ 8. පාඩම් කරන්න ........................

9. පිවිසෙන්න ........................ 10. උයන්න ........................

'ති' ප්‍රත්‍යය ඉවත් වූ පසු ශේෂ වන කොටසට **मा** යන නිපාතය එකතු කරමු. **मा** යන්නෙහි තේරුම 'එපා' යන්නයි.

උදා:- දුවන්න එපා **मा धाव ।** 

## අභ්‍යාසය 03

● හිස්තැන් පුරවමු.

**१. मा क्रीड ।** ........................ **२. मा पूजय ।** ........................

**३. मा लिख ।** ........................ **४. मा पिब ।** ........................

**५. मा पठ ।** ........................

1. ලියන්න එපා ........................ 2. කන්න එපා ........................

3. කියන්න එපා ........................ 4. සිනාසෙන්න එපා ........................

5. යන්න එපා ........................

• वसति । अटति । चरति । हरति । नयति । भवति । चलति । यच्छति । මේ ක්‍රියාපදයන්ට සුදුසු පරිදි **मा** නිපාතය යොදන්න.

## ක්‍රියාකාරකම 02

වාක්‍යයක කර්මපදයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. කර්තෘගේ ක්‍රියාවට අනුගත පදය කර්මපදය වේ. කර්තෘකාරක වාක්‍යක කර්මපදය ද්විතීයා විභක්තියෙන් තැබේ. එහි ප්‍රධාන අදියර දෙකකි.

ඍජුව ම කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය ද්විතීයා විභක්තියෙන් තැබීම.

| | | |
|---|---|---|
| सः - सा - बालकः<br>बालिका - नरः - पुरुषः<br>छात्रा - मुनिः - गुरुः | किम् | खादति ? |
| | अन्नम् - फलम् -<br>आम्रफलम् - सेवाफलम्<br>- द्राक्षम् - कदलीफलम् -<br>ओदनम् -मांसम् -<br>पयोहिमम् - अपूपम् | |

උදා:- सा किं खादति ?

ඇය කුමක් කයි ද? / ඇය කන්නේ මොනව ද?

सा सेवाफलं खादति ।

ඇය ඇපල් ගෙඩියක් කයි.

• උදාහරණයට අනුව අර්ථවත් වාක්‍යය 10ක් නිර්මාණය කරන්න.

## අභ්‍යාසය 04

| | | |
|---|---|---|
| ते - बालिकाः - शिशवः - गुरवः - मुनयः - भूपतयः - बालकाः | किम् | खादन्ति ? |
| | अन्नम् - फलम् - आम्रफलम् - सेवाफलम् - द्राक्षम् - कदलीफलम् - ओदनम् - मांसम् - पयोहिमम् - अपूपम् | |

උදා:- **ते किं खादन्ति** ? ඔවුහු කුමක් කත් ද? / ඔවුහු කන්නේ මොනව ද?

**ते सेवाफलं खादन्ति ।** ඔවුහු ඇපල් ගෙඩියක් කති.

- උදාහරණයට අනුව අර්ථවත් වාක්‍යය 10ක් නිර්මාණය කරන්න.

යම් ස්ථානයකට ගමන් කරන්නේ නම් එම ස්ථානය ද ද්විතීයා විභක්තියෙන් තැබිය යුතු ය.

| | | |
|---|---|---|
| सः - सा - बालकः - बालिका - नरः - पुरुषः - छात्रा - मुनिः - गुरुः | कुत्र | गच्छति ? |
| ते - बालिकाः - शिशवः - गुरवः - मुनयः - भूपतयः - बालकाः | | गच्छन्ति ? |
| | गृहम् - पाठालयम् - ग्रामम् - आश्रमम् - क्रीडांगणम् - कार्यालयम् - विद्यालयम् - आपणम् - सभाम् - पुस्तकालयम् - पत्रालयम् | |

උදා:- **सः कुत्र गच्छति** ? ඔහු කොහෙ යයි ද? / ඔහු කොහෙද යන්නේ ?

**सः कार्यालयं गच्छति ।** ඔහු කන්තෝරුවට යයි.

ते कुत्र गच्छन्ति ? ඔවුහු කොහෙ යත් ද ? / ඔවුන් කොහෙද යන්නේ ?

ते कार्यालयं गच्छन्ति। ඔවුහු කන්තෝරුවට යති.

- උදාහරණවලට අනුව අර්ථවත් වාක්‍යය 10ක් නිර්මාණය කරන්න.

## ක්‍රියාකාරකම 03

නාමපදයක් ප්‍රධාන වශයෙන් අදියර හතකට වර්ග කෙරේ. එහි තුන්වන අවස්ථාව තෘතීයා විභක්ති ලෙස හැඳින් වේ. කර්තෘගේ ක්‍රියාවට සහයෝගය දක්වන පද මේ තෘතීයා විභක්තියෙන් තැබේ.

උදා:- त्वं केन आगच्छसि ? නුඹ කොහොමද එන්නේ ?
अहं शकटेन आगच्छामि। මම කරත්තයෙන් එමි.

මෙහි පැමිණීම සඳහා කර්තෘට සහයෝගය දක්වා ඇත **शकटेन** පදය තෘතීයා විභක්තියෙන් තබා ඇත.

सः केन गच्छति ?

शकटेन - सर्वयानेन
धूमयानेन - गगनयानेन - द्विचक्रेण

## අභ්‍යාසය 05

| | | | |
|---|---|---|---|
| हस्तेन | - ................................ | नेत्रेण | - ................................ |
| गानेन | - ................................ | चषकेन | - ................................ |
| फरसुना | - ................................ | नेत्राभ्याम् | - ................................ |
| पादाभ्याम् | - ................................ | सर्वयानैः | - ................................ |
| हस्ताभ्याम् | - ................................ | पुष्पैः | - ................................ |

- පහත සඳහන් වාක්‍ය ඛණ්ඩ සංස්කෘතයට නඟන්න.

01. අතින් ලියයි.
02. බස් එකෙන් පැමිණෙයි.
03. දෑසින් බලයි.
04. කෝප්පයෙන් බොයි.
05. සිදුරෙන් බලයි.
06. පිහියෙන් කපයි.
07. දෑතින් ඔසවයි.
08. දිවෙන් රස විඳියි
09. කසයෙන් ගසයි.
10. රෝද දෙකින් පදවයි.

## ක්‍රියාකාරකම 04

तव नाम किम् ? (ඔබේ නම කුමක් ද?)

मम नाम कालिदासः। (මගේ නම කාලිදාස)

तस्य नाम किम् ? (ඔහුගේ නම කුමක් ද?)

तस्याः ग्रामः कुत्र (ඇගේ ගම කොහෙද?)

යනාදි පරිදි මගේ, අපගේ, ඔහුගේ, ගොවියාගේ ආදි නයින් අයිතියක් පිළිබඳ සාකච්ඡා කෙරේ නම්, එම පද හයවන විභක්තියෙන් තැබේ.

උදා:- एषः मम निचोलम्। तव स्यूतः कुत्र अस्ति ?
अस्माकं देशं रक्षणीयम्। मतुः गानेन तुष्यते।
खगस्य पत्रे स्तः। नद्याः जलेन वपति।

## අභ්‍යාසය 06

- සංස්කෘත භාෂාවෙන් ම පිළිතුරු සපයන්න.

१. तव नाम किम् ?
२. तव ग्रामः कुत्र अस्ति ?
३. तव पिता कुत्र कार्यं करोति ?
४. तव माता किं करोति ?
५. तव स्वसुः विद्यालयः कः ?
६. तव प्रियतमं विषयं किम् ?
७. तव प्रियम् अन्नं किम् ?
८. तव प्रियतमं फलं किम् ?
९. तव संकेतं किम् ?
१०. तव जन्मदिनं कदा ?

- සිංහලයට නගන්න.

१. एषा मम सखी।
२. एषः मम आदेशः।
३. मम गृहसंकेतः।
४. सः मम छात्रः।
५. सः मम दोषः न।
६. मम वचनं श्रुणु।
७. मम तु आक्षेपं नास्ति।
८. मद्दृशः एव मम पुत्रः।
९. मम शिरः भ्रमति एव।
१०. मम दूरभाषसंख्यां जानाति।

- පහත වගුව ඇසුරෙන් වාක්‍ය තනා සිංහලයට පරිවර්තනය කරන්න.

| | | |
|---|---|---|
| तस्य - तस्याः - मम - तव - आचार्यस्य - साधोः - मुनेः - पितुः | आज्ञा | अनुसरति। |
| तयोः - आवयोः - युवयोः - आचार्ययोः - साध्वोः - मुन्योः - पित्रोः | इच्छां | फलति - समाप्नोति |
| तेषां - तासां - अस्माकं - युष्माकं - आचार्याणां - साधूनां - मुनीनां - पितृणां | समाचारः | अनुगच्छ |

## ක්‍රියාකාරකම 05

**कुत्र + अपि - (කොහේවත්)**

- සිංහලයට නගන්න.

१. कुत्रापि मा गच्छ। ......................................................
२. कुत्रापि तया सह मा तिष्ट। ......................................................
३. कुत्रापि तेन सह मा गच्छ। ......................................................
४. कुत्रापि केवलं मा भ्रम। ......................................................
५. कुत्रापि मां त्यज्य मा गच्छ। ......................................................

**किञ्चित् + अपि - (මොකවත්)**

- සංස්කෘතයට නගන්න.

1. මොකවත් බොන්න එපා. ......................................................
2. මොකවත් දෙන්න එපා. ......................................................
3. මොකවත් හොරෙන් ගන්න එපා. ......................................................
4. මොකවත් ඔහුට කියන්න එපා. ......................................................
5. මොකවත් කළුලෑල්ලේ ලියන්න එපා. ......................................................

**कथम् + अपि - (කොහොමහරි)**

- සිංහලයට නගන්න.

१. कथमपि मां मा विस्मर। ......................................................
२. कथमपि वार्तापत्रिका आनय। ......................................................
३. कथमपि समये तत्र गच्छत। ......................................................
४. कथमपि तं चोरं गृहाण। ......................................................
५. कथमपि संस्कृतं सम्यग् पठत। ......................................................

कदा + अपि - (කවදාවත්)

१. कदापि पुनः तत्र मा गच्छ।  ..........................................................
२. कदापि केवलं असत्यं मा वद।  ..........................................................
३. कदापि तया सह मा सञ्चर।  ..........................................................
४. कदापि तथा मा कुरु।  ..........................................................
५. कदापि मातापितरं मा विस्मर।  ..........................................................

## අභ්‍යාසය 07

- कुत्रापि - किञ्चिदपि - कथमपि - कदापि යන ප්‍රශ්නවාචී පද යොදා වාක්‍ය 10 ක් නිර්මාණය කරන්න.

कदा - यदा - तदा - सर्वदा - सदा - एकदा යන පදයන්හි යෙදෙන दा ප්‍රත්‍ය කාලාර්ථය හඟවයි.

උදා:- कदा त्वं प्रभाते उत्तिष्ठसि ? කීයට ද ඔබ උදේ නැගිටින්නේ ?

- සිංහලයට නගන්න.

१. कदा सा प्रातरासं खादति ?  ..........................................................
२. कदा तव जन्मदिनम् ?  ..........................................................
३. कदा पिता कार्यालयं गच्छति ?  ..........................................................
४. कदा नक्षत्राणि प्रकाशन्ते ?  ..........................................................
५. कदा दन्तधावनं करोषि ?  ..........................................................

किमर्थम् - (ඇයි)

උදා:- ඇයි පමා වෙන්නේ ? किमर्थं विलम्बः ?

ඇයි එහෙම කියන්නේ ? तथा किमर्थं वदति ?

• සිංහලයට නගන්න.

१. अहं किमर्थम् असत्यं वदामि ?

२. विना कारणं किमर्थं रोदिसि ?

३. शुनकः किमर्थम् इत्थं भषति ?

४. किमर्थम् इति पृच्छति चेत् भवान् कुप्यति ?

५. संस्कृतेन सम्भाषणं कर्तुं किमर्थं सङ्कोचः ?

६. किमर्थम् अद्य विद्यालयं न गच्छन्ति ?

७. किमर्थं तथा मां पश्यति ?

८. किमर्थम् एवं तां परित्यज्य प्रवासं गमिष्यसि ?

९. किमर्थम् असत्यं वदसि ? सत्यं गूही ?

१०. तया सार्धं तत्र किमर्थं पठसि ?

• සංස්කෘතයට නගන්න.

1. ඇයි මොකුත් කන්නේ නැත්තේ ? ..............................................
2. ඇයි කට අරින්නේ නැත්තේ ? ..............................................
3. ඇයි ඉක්මණින් කොපවෙන්නේ ? ..............................................
4. ඇයි එහෙ යන්න කැමැති නැත්තේ ? ..............................................
5. ඇයි ඔහොම කරන්නේ ? ..............................................
6. ඇයි කවුරුවත් එන්නේ නැත්තේ ? ..............................................
7. ඇයි නිහඬව ඉන්නේ, ඇතුළට එන්න. ..............................................
8. ඇයි අම්මා අපිත් එක්ක කථා නැත්තේ ? ..............................................
9. ඇයි ඇය එහෙම ඔබට කියන්නේ ? ..............................................
10. ඇයි කලින් අභ්‍යාස නොකරන්නේ ? ..............................................

## අභ්‍යාසය 08

• සිංහලයට නගන්න.

१. कोऽपि केन सह तत्र वसति ?

२. के अद्य विद्यालयं न आगतवन्तः किल ?

३. कः नित्यमेव कया सार्धं भ्रमति ?

४. कस्मिन् ग्रामे ते प्रतिवसन्ति ?

५. कैः सह क्रीडन्ति सायं तत्र ?

६. कस्मै वस्त्रम् अन्नं च ददाति ?

७. केभ्यः नगरेभ्यः करः चिनोति ?

८. कस्य माता विहारमहादेवी किल ?

९. केषु स्नेहं प्रदर्शयसि ?

१०.काभिः सह ते कस्मिन् वने कान् मृगान् व्यापादयन्ति ?

• පහත සඳහන් ප්‍රශ්නවලට පන්තියේ යහළුවන්ගෙන් පිළිතුරු අසා ලියන්න.

१. तव नाम किम् ?

२. का तव माता ?

३. भवत्याः नाम किम् ?

४. तव पितुः नाम किम् ?

५. किम् - माता गृहे एव वसति ?

६. अपि - पिता कुत्र सेवां करोति ?

७. कति सदस्याः गृहे प्रतिवसन्ति ?

८. तव अग्रजः कः इति वदतु ?

९. तव पितामहस्य नाम किम् ? सः कुत्र केन सह वसति ?

१०. स्वसा किं करोति ? अनुजः कुत्र पठति ?

११. ते कस्मिन् वर्गे कानि कानि पठन्ति ?

१२. तव प्रियतमः भाषा का ?

१३. तव मातुः प्रियतमः अन्नं किम् ?

१४. आगामि सप्ताहे कुत्र गमिष्यसि ?

१५. कदा त्वं प्रभाते उत्तिष्ठसि ?

१६. कदा केन सह प्रातरासं भुञ्जति ?

१७. सायं कदा पूजां करोति ?

१८. लङ्कायां कुत्र कुत्र गन्तुम् इच्छसि ?

१९. कस्मिन् स्नेहं श्रद्धा वा अस्ति ?

२०. अनागते कः भवितुम् इच्छसि ?

## පුනරීක්ෂණ

අලුත් වාක්‍යය තනමු.

| | | |
|---|---|---|
| सः - सा - बालकः - कविः - गुरुः | इतिहासं<br>गणितं<br>आङ्गलभाषां<br>संस्कृतभाषां<br>महाभारतं<br>पञ्चतन्त्रं | पठति । |
| त्वम् | | पठतः। |
| अहम् | | पठन्ति। |
| तौ - बालकौ - कवी - गुरू | | पठसि। |
| युवाम् | | पठथः। |
| आवाम् | | पठथ। |
| ते - बालकाः - कवयः - गुरवः | | पठामि। |
| यूयम् | | पठावः। |
| वयम् | | पठामः। |

| | | |
|---|---|---|
| सः - सा - बालकः - कपिः - गुरुः | न - नित्यम् - बहु - स्वादु अन्नम् - अल्पम् - अत्यल्पम् - उदरपूरम् - सामिषम् - निरामिषम् - किमपि - मन्दं मन्दम् - सन्तोषेण - बहुकालम् - त्वरया - शनैः शनैः | खादति |
| त्वम् | | खादतः |
| अहम् | | खादन्ति |
| तौ - बालकौ - कपी - गुरू | | खादसि |
| युवाम् | | खादथः |
| आवाम् | | खादथ |
| ते - बालकाः - कपयः - गुरवः | | खादामि |
| यूयम् | | खादावः |
| वयम् | | खादामः |

पङ्को हि नभसि क्षिप्तः क्षेप्तुः पतति मूर्धनि।
පඞ්කෝ හි නභසි ක්ෂිප්තඃ ක්ෂේප්තුඃ පතති මූර්ධනි
උඩට දමන ලද මඩ එය දැමූවහුගේ හිස මත වැටේ.

पयः पानं भुजङ्गानां केवलं विषवर्धनम्।
පයඃ පානං භුජංගානාං කේවලං විෂවර්ධනම්
කිරිබීම සර්පයන්ගේ විෂ වැඩීම පිණිස පමණක් හේතු වේ.

पयो गते किं खलु सेतुबन्धः।
පයෝ ගතේ කිං ඛලු සේතුබන්ධඃ
ජලය බැස ගිය විට ඒදඬු බඳින්නේ කුමටද?